# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

සමාජීය විද්‍යා පීඨය

## සංචරණය සහ සංස්කෘතික සම්පත් කළමනාකරණය

## සංචරණයේ ඉතිහාසය - TCRM 18224

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. ලෝක සංචාරක ඉතිහාසය තුළ ඊජිප්තු, ග්‍රීක සහ රෝම යන යුගයන්හි වැදගත්කම විමසන්න. (ලකුණු 20 යි)

02. 17 වන සියවසෙහි සමාජගත වූ 'මහා සංචාරය' (Grand Tour) යන සංකල්පය හඳුන්වා එහි සමාජයීය පසුබිම පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 20 යි)

03. ලෝක සංචාරණ ඉතිහාසය තුළ ජල සම්භාහන නිකේතන (Spa Resorts) <u>සහ</u> වෙරළ නිකේතන (Beach Resorts) සංචාරක ව්‍යාපාරයට දැක්වූ දායකත්වය පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

04. කාර්මික විප්ලවය <u>සහ</u> දෙවන ලෝක සංග්‍රාමය සංචාරක ව්‍යාපාරයේ ප්‍රගමනය කෙරෙහි දායක වූ ආකාරය පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

05. බහුජන සංචාරණය (Mass Tourism) සමාජගත කිරීමෙහිලා තෝමස් කුක් දැක්වූ දායකත්වය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 20 යි)

06. i. 1930 සිට 1980 දක්වා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ මූලාරම්භය හා විකාශනය පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

    ii. වර්ෂ 2000 න් පසුව අද දක්වා ශ්‍රී ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ සුවිශේෂී සන්ධිස්ථාන පිළිබඳ විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 යි)

07. ඉන්දියාවේ අතීත සංචාරණයේ පසුබිම හා මෑතකාලීන සංචාරක ව්‍යාපාරයේ විකාශනය පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20 යි)

08. පහත මාතෘකා අතුරින් <u>දෙකක් (02)</u> සඳහා ප්‍රමාණවත් කෙටි සටහන් සපයන්න.

    i. චීනයේ සංචාරක ඉතිහාසය පිළිබඳ සාකච්ඡා කරන්න.
    ii. සංචාරක කර්මාන්තයේ ප්‍රගමනය සඳහා සංචලන යුගයෙහි වැදගත්කම පෙන්වා දෙන්න.
    iii. මධ්‍යතන යුගයේ (ක්‍රි.ව. 500-1400) සංචාරක කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය කරන්න.

    (ලකුණු 10x2 = 20 යි)

*********************************